# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2013

වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය,
'ගොවිජන මන්දිරය',
අංක 80/ 5, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.



## මහින්ද චින්තන ඉදිරි දැක්ම . . .

- පසුගිය දශක කීපයක අවිධිමත් සංවර්ධනය හා ත්‍රස්තවාදය විසින් අපේ ජාතික වනෝද්‍යාන ගිල ගැනීම නිසා අලි ඇතුන් ගම් වැදී අලි මිනිස් ගැටුම නිර්මාණය විය. මේ සඳහා පිළියමක් ලෙස 2009 දී ගජමිතුරෝ වැඩසටහන ක්‍රියාත්මක කළෙමි. එමගින් අලි පාලන ඒකක පිහිටුවීම හා අලි වැට ඉදිකිරීම වේගවත් කළ අතර පසුගිය වසර දෙක තුළ පමණක් විදුලි වැට කි.මී. 600ක් ඉදිකිරීම හා නවීකරණය සිදු කළෙමි. උතුරු නැගෙනහිර ද ඇතුළුව මෙම ගැටළුවට මුහුණපාන සියළු ගම්මාන වල විදුලි වැට ඉදිරි වසර තුනේදී අවසන් කරමි.

- ත්‍රස්තවාදය නිසා වැසී ගිය විල්පත්තු, කුමන, යාන්ඔය, චුන්ඩිකුලම ආදී සියළු වන උද්‍යාන නවීකරණය කර ඉදිරි වසර තුළ විවෘත කරමි.

## ගරු අමාත්‍යතුමාගෙන් ......



වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය මා විසින් භාරගෙන වර්ෂයක් ඉක්මවීමෙන් පසු අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ප්‍රගති වාර්තාවට පූර්විකාවක් ලිවීමට ලැබීම මාගේ ඉමහත් තෘප්තියට හේතුවක් වේ.

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන ඉදිරි දැක්ම යටතේ අමාත්‍යාංශයේ කොනක එල්ලී තිබුණු දැවැන්ත ආයතනයක් වන වනජීවී අමාත්‍යාංශය වෙනමම අමාත්‍යාංශයක් ලෙස නම්කොට ඒ සඳහා ප්‍රථම අමාත්‍යවරයා ලෙස මා තෝරා පත්කිරීම සම්බන්ධයෙන් මාගේ ගෞරවය හා ස්තුතිය පුදකර සිටිමි.

තවද, මා කෙරෙහි විශ්වාස තබා ජෛව විවිධත්වය පිළිබඳ සම්මත පනත මගින් රජයට හා ජනතාවට ලැබිය යුතු නිසි පංගුව ලබාදී සමතුලිත පාරිසරික පද්ධතියක් සකස් කිරීමේ මහඟු වගකීම මා වෙත භාරකර ඇති අතර එය පෙරදැරි කරගනිමින් අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනයට අනුරූපව ක්‍රියා කරන මෙම අමාත්‍යාංශයේ ප්‍රගතියට සහාය ලබාදෙන ලේකම්තුමා, අධ්‍යක්ෂ ජනරාල්තුමා ප්‍රමුඛ අමාත්‍යාංශ නිලධාරී මණ්ඩලයට ද, රාජ්‍ය නොවන සංවිධාන සහ දිසාපතිතුමන්ලා සහ උපදිසාපතිවරුන්ගේ මෙන්ම ජනතා සහාය ද මගේ උපරිම ඇගයීමට ලක්වේ.

අලි මිනිස් ගැටුමට තුඩුදුන් කරුණු විමසා තිරසාර විසඳුම් යෙදීමත්, එමෙන්ම විනාශාභිමුඛයට පත් වෙමින් සිටින සත්ත්ව ගණයා මෙන්ම ජලජ ජීවීන් සංරක්ෂණයට ද විශේෂඥ උපදෙස් මෙන්ම විදේශීය ඥානය ලබාගැනීමට ද මෙම වර්ෂය තුළ ක්‍රියා කරන ලදී. ඒ සඳහා ශ්‍රී ලංකාවේ සිටින ප්‍රමුඛ විශේෂඥයකු වන මහාචාර්ය සරත් කොටගම මහතා ජ්‍යෙෂ්ඨ උපදේශකයකු ලෙස පත් කර, ඔහුගේ සුවිශේෂ ඥානය ද පාදක කරගෙන වනජීවී පනත් කාලානුරූපව ප්‍රතිසංස්කරණය කිරීමට ද ක්‍රියා කරන ලදී.

වනජීවීන්ගේ සංරක්ෂණයට ප්‍රබල බාධාවක් වී ඇති අද ශ්‍රී ලංකාව මුහුණ දී සිටින ප්‍රධාන අර්බුදයක් වන පරිසර ප්‍රශ්න ද එක්වී ඇත. පරිසර ප්‍රශ්නය විසඳීමට දීර්ඝකාලීන මෙන්ම කෙටි කාලීන ක්‍රියාමාර්ග වෙත අවතීර්ණ වීම අත්‍යාවශ්‍ය කාර්යයක් ලෙස සලකා එබඳු පරිසර ගැටළු කීපයක් වෙන්කර හඳුනාගෙන තිබේ. වනාන්තර විනාශවීම, පස, ජලය සහ වාතය දූෂණය වීම, වෙරළ ආශ්‍රිත දූෂණය සහ ජලජ සම්පත් විනාශ වීම, මෙම කරුණු වනජීවී සංරක්ෂණයට ප්‍රබල බාධාවක් වන බැවින් වන සතුන් ආරක්ෂාව සඳහා පරිසර අමාත්‍යාංශය සමග එක්ව ක්‍රියාකාරී වැඩසටහන් ඇරඹීමට කටයුතු කර තිබේ. වනාන්තර විනාශවීම තුළින් වනජීවී සම්පත විනාශවීම වැළැක්වීමට ගෙන ඇති විසඳුම් ද විශේෂ කරුණක් ලෙස හැඳින්විය හැක.

1899 වසරේ දී කැළෑ දෙපාර්තමේන්තුවේ අධිපතිව සිටි ඒ.එෆ්. බ්‍රවුන් මහතා තම සටහන් වල මෙවැනි සඳහනක් කර ඇත.

" මේ රටේ මුළු වර්ග සැතපුම් ප්‍රමාණය වන 25,365 න් 20,000 වැඩි ප්‍රමාණයක් කැළෑවෙන් වැසී ගොස්ය. එහෙත් කැලෑවට ඇරුණු ප්‍රමාණයෙන් හොඳ වනාන්තර ඇත්තේ සුළු කොටසකි. ඉතිරි යෙන් බොහෝ හරියක් තිබෙන්නේ පතන නැත්නම් වන ලැහැබයි." එදා එසේ සුවිශාල වන ආවරණයක් තිබුණු රටකට වර්තමානයේ දී වනවගා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සිදුවීම ඉතිහාසයේ සරදමක් බඳුයි. 1900 දී අපේ රට තුළ වනාන්තරයෙන් වැසීගිය බිම් ප්‍රමාණය 70% ක් විය. එය 1963 වන විට 44% දක්වාත්, 1985 වන විට 23% දක්වාත්, 1990 වන විට 21% දක්වාත්, සීඝ්‍රයෙන් අඩුවෙමින් පවතී. 1960 සිට 1990 දක්වා වූ දශක තුන තුළ පමණක් හෙක්ටයාර් දස ලක්ෂයක පමණ ස්වභාවික වනාන්තර විනාශ වී ඇත. මේ වන විනාශයට ප්‍රධාන කරුණු කිහිපයක් හඳුනාගත හැකියි. ජනගහනය අධික වීම නිසා නව ජනාවාස ඇති වීම, සංවර්ධන ව්‍යාපෘති සඳහා කැළෑ එළි කිරීම්, බලශක්ති මාධ්‍යක් වශයෙන් දැව ලබාගැනීම, ගොඩනැගිලි ඉදිකිරීම් අංශයට දැව ලබා ගැනීම මෙයින් වන සතුන් විනාශවී ගොස් ඇත.

වනාන්තර විනාශවීම තුළින් දරුණු ස්වාභාවික විපත්වලට අද අප මුහුණ දෙමින් සිටියි. පස සේදී යෑම, නාය යෑම, ජල ගැලීම්, වායු ගෝලීය උෂ්ණත්වය වැඩිවීම, දරුණු නියඟවලට මුහුණදීමට සිදුවීම, ජල උල්පත් විනාශ වීම වන සතුන්ගේ වාසභූමි විනාශ වීම. එවිට වන සත්තු මිනිසාට පහරදේ.

වන සතුන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් බලපවත්වන ප්‍රධාන පනත් කිහිපයක් තිබෙන අතර ඒවා කාලීන වනජීවී සම්පත සුරක්ෂිත වන ආකාරයට අනුරූප සංශෝධනයට ක්‍රියාකර තිබේ.

- 1907 " කැලෑ ආඥා පනත"
- 1924 දි සම්මත කරගනු ලැබූ " පැළෑටි ආරක්ෂා කිරීමේ ආඥා පනත"
- 1947 දී සම්මත කරගනු ලැබූ " රජයේ ඉඩම් ආඥා පනත"
- 1951 දී සම්මත කරගනු ලැබූ අංක 25 දරණ " පස සංරක්ෂණ පනත"
- 1964 දී සම්මත කරගනු ලැබූ අංක 44 දරණ " වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂා කිරීමේ පනත" මගින් ජාතික වන සත්ත්ව ආරක්ෂා කිරීමත් ඔවුන්ගේ මස්, හම් මේ රටේදී මෙන්ම විදේශයන්හි විකිණීම තහනම්ය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගෙනා මේ පනත වන සතුන් ආරක්ෂාවට ඉතාම වැදගත් වූවකි. එම නිසා සමෝධානිත වනජීවී සම්පත් සුරක්ෂිත කිරීමේ පනතක් සකස් කිරීම වැදගත්වේ.

ශ්‍රී ලංකාවේ වනජීවී සංචාරක නිකේතන හා එහි කඳවුරු බිම් අන්තර්ජාලය ඔස්සේ වෙන්කරවා ගැනීමට ලැබීම අප ලැබූ තවත් අතිවිශාල ජයග්‍රහණයකි. ඒ තොරතුරු තාක්ෂණ දියුණුවේ අංගයකි.

අප අමාත්‍යාංශයේ කඳවුරු බිම් වෙන්කරවා ගැනීම සඳහා වන මූල්‍ය ගෙවීම් ද ණය වරපත් සහ ජංගම දුරකථන ඔස්සේද කරගත හැක.

ඊ සේවාව මගින් කඳවුරු වෙන්කරවා ගැනීමට හැකිවීම විදේශ සංචාරකයින්ට විශාල පහසුවකි. දේශීය සංචාරකයින්ට ද අගනුවරට ඒමට ඇති ගැටළුව සහ අපහසුතාවය මග හැරී යයි. ඇතැම් විට එයට යන වියදම වෙන් කිරීමට යන වියදමට වඩා වැඩිය. රස්තියාදුව හා එය ඉටු නොවුනහොත් ඇතිවන කම්පනය දැරිය නොහැක.

වනජීවී සංචාරක නිකේතන හා කඳවුරු බිම් 44 ක් ඇති අතර නැරඹීමට එන සංචාරකයන් දේශීය සහ විදේශීය වශයෙන් ලක්ෂ 12 ක් ඉක්මවයි. මෙම ක්‍රමය මගින් සංචාරක සේවාව යථා කාලයේ දෙගුණයක් විය හැක.

අප අමාත්‍යාංශයේ මුඛ්‍ය පාඨය (MOTO) වනුයේ “ මනුෂ්‍යයා පරිසරය සුරකින විට පරිසරය මනුෂ්‍යයා සුරක්ෂිත කරයි.“ යන්නයි.

මෙම ක්‍රියාවලියේ ඇති එක් වැදගත්කමක් නම් රජයේ කාර්යාල විවෘත වී තිබෙන වේලාවන්ට සීමාවී නොවී ඔවුන්ට නිවසේදීම සෙනසුරාදා දිනක වුවද එම අවශ්‍යතාවයන් පහසුවෙන් ඉක්මනින් හා සම්පූර්ණයෙන් ඉටුකරවා ගත හැකිවීමය. එය , ඊ - බිස්නස්, ඊ - කොමර්ස් යන අංශවලටද විස්තාරණය කල හැක. එමෙන්ම ලෝකයේ ඉතාමත් දියුණුව පවතින “ ඇප්ස් - ඔන්- ටැප් ක්‍රමය (APPS- ON - TAP) යොදවා සිදුවන වංචා යනාදිය නැති කල හැක.

කැස්බෑ සංරක්ෂණ හා වල්ලාපට්ටා ශාක වංචාව , මත්ස්‍යන් හා කිඹුල් හූණන් ඇතුළු ජීවීන් වංචාව වැළැක්වීමට ක්‍රියාකර ඇත.

අලි මිනිස් ගැටළු අවම කිරීමට 2014 අයවැයෙන් විශාල මුදල් ප්‍රමාණයක් වෙන් කර ඇති අතර, දිසාපතිවරුන් හා උපදිසාපතිවරු මාර්ගයෙන් ඒවා ඉටුකරන බැවින් ජනතා සේවය කඩිනම් කර ඇත.

**ගාමිණී විජිත් විජයමුණි සොයිසා**

**වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍ය**

## ලේකම්තුමාගෙන් . . . . . .



නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට වනජීවී සම්පත් සංරක්ෂණ නමින් නව අමාත්‍යාංශයක් පිහිටුවීමට අතිගරු ජනාධිපතිතුමා ගත් තීරණය අතිශයින් කාලෝචිත පියවරක් ලෙස හැඳින්විය හැක. එම අමාත්‍යාංශයේ ප්‍රථම ලේකම් වරයා ලෙස කටයුතු කිරීමට හැකි වීම මා ලත් භාග්‍යයක් ලෙස සළකමි. නව අමාත්‍යාංශය පිහිටුවා වසරකින් පසු එළි දක්වන කාර්ය සාධන වාර්තාව සඳහා පණිවිඩයක් නිකුත් කරනුයේ හදපිරි සතුටිනි.

1937 දී ප්‍රකාශයට පත් කරන ලද වන සත්ත්ව හා වෘක්ෂලතා ආඥාපනතට හා එහි සංශෝධනයන්ට අනුව තම අයිතීන් වෙනුවෙන් හඬක් නොනැගිය හැකි සත්ත්ව ප්‍රජාවගේ අයිතීන් මෙන්ම ජීවී අජීවී සියළු ස්වභාවික සම්පත් ආරක්ෂා කිරීමේ වගකීම ඉටුකරමින් අනාගත පරපුර වෙත වනජීවී උරුමයන් සංරක්ෂණය කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ පවතින වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මහගු මෙහෙවරක යෙදෙමින් සිටියි. මෙම මෙහෙවර ඉටුකිරීම සඳහා 2013 වර්ෂයේ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රු.මි. 643ක් දෙපාර්තමේන්තුව වෙත වෙන්කර ඇත. මෙම ප්‍රතිපාදන යටතේ විදුලි වැට ඉදි කිරීම හොරොව්පතාන, ලුණුගම්වෙහෙර වනඅලි රුඳවුම් මධ්‍යස්ථාන පිහිටුවීම, දැයට කිරුළ ජාතික ප්‍රදර්ශනයට සමගාමීව ජාතික උද්‍යාන තුළ පාරිසරික කටයුතු ප්‍රවර්ධනය හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමට කටයුතු කර ඇති අතර අභය භූමිය තුළ වෙසෙන වන සතුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම මෙන්ම අන්තරායට ලක් වූ සත්ත්ව විශේෂ සංරක්ෂණ කිරීම සඳහා ද ආරක්ෂිත ජාලය ස්ථාපිත කිරීමටත් පියවර ගෙන ඇත.

ජාතික වනෝද්‍යාන නැරඹීම සඳහා පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් සංඛ්‍යාව දිනෙන් දින ඉහළ යන අතර ඔවුන් සඳහා පහසුකම් වැඩි දියුණු කිරීමට කටයුතු කරනු ලබයි. සංචාරක නිකේතන වැඩි දියුණු කිරීමටත්, නව සංචාරක නිකේතන ඉදිකිරීමටත්, ජාතික උද්‍යාන තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමටත් කටයුතු කර ඇත. රටේ සාමය ස්ථාපිත කිරීම හා ජාතික උද්‍යානයන්හි පහසුකම් ප්‍රවර්ධනය කිරීමෙන් ජාතික උද්‍යානයන්හි ආදායම වර්ධනය වී ඇති අතර එමගින් ජාතික ආදායමට ඉහළ දායකත්වයක් ලබාදීමට හැකිවී ඇත.

අමාත්‍යාංශය යටතේ ඇති වනජීවී භාරය හරහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර සොබාදහමේ උරුමයන් අනාගත පරපුර වෙත දායාද කිරීමේ අරමුණින් පාසල් අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම ආරක්ෂිත කළාප තුල සංවිධාන ශක්තිය දියුණු කිරීම සහ පාරිසරික නීති ප්‍රචලිත කිරීමේ කටයුතු සිදු කෙරේ.

මහින්ද චින්තනය පිළිවෙලට  අනුව ගහකොළ සතා සිවුපාවා සමග බැදුණු තිරසාර සංවර්ධනයක් කරා යන ගමන සඳහා දායකත්වය නොමදව ලබා දීමටත්  අමාත්‍යාංශයේ කටයුතු සාර්ථකව ඉටු කිරීම සඳහා නිරන්තරයෙන් මග පෙන්වමින් නායකත්වය හා උපදේශකත්වය ලබාදෙන වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍ය ගාමිණී විජිත් විජයමුණි සොයිසා මැතිතුමාට මාගේ හෘදයාංගම ස්තූතිය පුදකරමි.  මෙම ග්‍රන්ථය සැකසීමේ කටයුතු  වල නියැලුණු නිලධාරීන්ට ද අවශ්‍ය දත්ත හා තොරතුරු ලබාදුන් නිලධාරීන්ට  හා භාෂා පරිවර්තන කටයුතු කරදුන් නිලධාරීන්ටත් මාගේ ස්තූතිය පුදකරමි.

**ඉංජි. උදේනි වික්‍රමසිංහ**
**ලේකම්**

# පටුන


වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය 13

පාලන අංශය 15

සැලසුම් අංශය 20

සංවර්ධන අංශය 22

ගිණුම් අංශය 25

අභ්‍යන්තර විගණන අංශය 27

නීති අංශය 29

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව 31

ශ්‍රී ලංකා වනජීවී භාරය 47

# වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

## දැක්ම

" ජෛව විවිධත්වය හා වනජීවී උරුමයන් සුරැකි දේශයක් "


## මෙහෙවර

" ඵලදායී වනජීවී රක්ෂිත ජාලයක් පවත්වා ගෙන යාම තුළින්, මනා සහජීවනයක් සහිතව සියළුම සත්ත්ව විශේෂයන්ට හා මිනිසුන්ට ජීවත්වීමට අවකාශ සලසාදීම. "

## ප්‍රධාන කාර්යයන්

- 1937 අංක 02 දරණ වන සත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂණ ආඥා පනත ක්‍රියාත්මක කරවීම.
- අන්තර්ජාතික වනජීවී සම්මුතීන් ක්‍රියාත්මක කරවීම.
- වනජීවී උරුමයන් හා ජෛව විවිධත්වය සුරැකෙන අයුරින් මිනිසුන්ට හා අනෙකුත් සියළුම සත්ත්ව විශේෂයන්ට ජීවත්වීමේ අයිතිය සුරැකීම සඳහා වන ප්‍රතිපත්ති තීරණ ගැනීම හා ඒවා ක්‍රියාත්මක කරවීම.
- ජාතික උද්‍යාන සංවර්ධනය තුළින් පාරිසරික සංචාරක කර්මාන්තය වර්ධනය කිරීමට දායක වීම.
- වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මෙහි අඩංගු කාර්යයන් මාසිකව කාර්තුමය හා වාර්ෂිකව ඇගයීම, මෙහෙයවීම හා අධීක්ෂණය.
- වනජීවී භාරය හා වන සත්ත්ව සංරක්ෂණ අරමුදල සම්බන්ධ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය.

## අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක දෙපාර්තමේන්තු හා ආයතන



# පාලන අංශය

## හැඳින්වීම

පාලන අංශය යටතේ අමාත්‍යාංශයේ මෙන්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වනජීවී භාරය යන ආයතනයන්හි පරිපාලන කටයුතු සිදු කරනු ලබයි.

## කාර්යභාරය

- අමාත්‍යාංශය තුළ සාමාන්‍ය පරිපාලනය හා විනය පවත්වාගෙන යාම.
- සංවර්ධන, මුදල්, විගණන, සැලසුම්, නීති, යන අංශ අතර සම්බන්ධීකරණයෙන් මානව හා භෞතික සම්පත්වල පරිපාලන කටයුතු පවත්වා ගෙන යාම.
- අමාත්‍යාංශයට අයත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වනජීවී භාරය යන ආයතනවල පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ කටයුතු ඉටු කිරීම.

# 2013.12.31 දිනට ප්‍රගතිය

- 2013.12.31 දිනට වැටුප් වර්ධක ලැබීම සඳහා හිමිකම් ලබා තිබූ නිලධාරීන් 46 දෙනෙකු සඳහා වැටුප් වර්ධක ගෙවා ඇත.
- 2013.12.24 දින කාර්යාල සේවක සේවයේ III පන්තියේ සේවකයින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය පවත්වා ඇත.
- පාලන අංශයට ලැබෙන සියළුම ලියාපදිංචි හා සාමාන්‍ය ලිපි අප්‍රමාදව කාර්යාලයට ලබාදීම හා ආයතන වලට බෙදීම සිදු කර ඇත.
- මාණ්ඩලික නිලධාරීන් 15 කගේ දුරකථන (ජංගම ,ස්ථාවර හා නිවාස) බිල්පත් හා පොදු දුරකථන දෙකෙහි බිල්පත් ගෙවා ඇත.
- අමාත්‍ය කාර්ය මණ්ඩලයේ දුකරථන (ජංගම ,ස්ථාවර හා නිවාස) 30ක ගෙවීම් කටයුතු සිදුකර ඇත.
- නිලධාරීන්ගේ නිවාඩු විස්තර ඔවුන් වෙත ලබාදි ඇත. (පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ඇතුලත් කර ඇත.)
- අමාත්‍ය මණ්ඩල සංදේශ 12 ක් අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.
- 2013 වසරේදී වනදිවි සැරිය පුවත් පතේ කලාප 05 ක් මුද්‍රණය කිරීම සඳහා අදාළ ආයතන සම්බන්ධීකරණ කටයුතු සිදුකර ඇත.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ බඳවා ගැනීමේ පරිපාටි 14 න් 09 ක් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඇත.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරු 01 ක් , වාස්තු විද්‍යාඥ සේවයේ III /II තනතුරු 01 ක් හා රියදුරු තනතුරු 08ක් අනුමත කරගෙන ඇත.
- නව බඳවා ගැනීම් පටිපාටිවලට අනුව පුහුණු පාඨමාලා කාලය තුළදී වන සත්ත්ව නියාමක හා වන සත්ත්ව අඩවි ආරක්ෂක නිලධාරීන් සඳහා දීමනා ගෙවීමට ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගෙන ඇත.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ තනතුරේ සේවය කරන ලද බී.වී.ආර්. ජයරත්න මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තු) තනතුරට උසස් කිරීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඇත.

## මානව සම්පත් සංවර්ධනය උදෙසා ලබා දුන් පුහුණුවීම්

පුහුණු කිරීම හා හැකියා වර්ධනය සඳහා 2013 වර්ෂයට අනුමත වූ ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් දස ලක්ෂයක් (රු.1,000,000.00 )වූ අතර එම සීමිත ප්‍රතිපාදන යටතේ 2013වර්ෂය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම උදෙසා නිලධාරීන් විවිධ පුහුණු පාඨමාලා සඳහා යොමු කරන ලදී. මෙහිදී නිලධාරීන්ගේ කාර්ය සාධනය හා ඵලදායීතාව ඉහල නැංවීම සඳහා අවශ්‍ය වන පුහුණු අවශ්‍යතාවයන් හඳුනා ගෙන ඒ අනුව අවශ්‍ය වන්නා වූ පුහුණුවීම් ලබා දීමට කටයුතු කරන ලදී.

| පුහුණුවේ නම | පුහුණුව ලැබූ ආයතනය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | පුහුණු ගාස්තුව (රු.) |
|---|---|---|---|
| 1. උසස් භාෂා මාධ්‍ය පාඨමාලාව (සිංහල) | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 01 | 8000.00 |
| 2. Awareness Programme on Sri Lanka Public Sector Accounting Standard | Association of Public Finance Accountants of Sri Lanka | 01 | 500.00 |
| 3. Government Payroll Management System | Academy of Financial Studies | 02 | 24000.00 |
| 4. CIGAS | Academy of Financial Studies | 02 | 24000.00 |
| 5. පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය | 03 | 45000.00 |
| 6. විනය කාර්යය පරිපාටිය පිළිබඳ රාජ්‍ය අංශයේ ආයතන නිළධාරීන් දැනුවත් කිරීමේ තුන්දින පුහුණු වැඩසටහන | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 04 | 30000.00 |
| 7. Public Procurement Procedures | Skills Development Fund Ltd. | 03 | 24000.00 |
| 8. Drivers and Minor Employees on Correct Attitudes and Motivation | Skills Development Fund Ltd. | 06 | 27000.00 |
| 9. Two day Workshop on office Management and Office Procedures | Skills Development Fund Ltd. | 08 | 64000.00 |

| පුහුණුවේ නම | පුහුණුව ලැබූ ආයතනය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | පුහුණු ගාස්තුව (රු.) |
|---|---|---|---|
| 10. මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | කොළඹ විශ්ව විද්‍යාලය | 01 | 112500.00 |
| 11. Evaluation for Change | Sri Lanka Evaluation Association | 01 | 18000.00 |
| 12. Disciplinary Procedures | Skills Development Fund Ltd. | 01 | 8000.00 |
| 13. නවක උපාධිධාරීන් හා කළමනාකරණ සේවයේ නිලධාරීන් සඳහා කාර්යාල කළමනාකරණ පුහුණුව | අමාත්‍යාංශයේදී | 20 | 16210.00 |
| 14. කාර්යාල සේවක සේවයේ කාර්යාභිවර්ධන පුහුණුව | අමාත්‍යාංශයේදී | 09 | 4900.00 |
| 15. Out Bound Training | Randenigala Training Center | 40 | 368262.50 |
| 16. Annual Verification and Public Assets Disposal Procedures | Skills Development Fund Ltd. | 02 | 9000.00 |
| 17. Maintenance of Personal File | Skills Development Fund Ltd. | 02 | 9000.00 |
| 18. Workshop on Salary Conversions | Skills Development Fund Ltd. | 02 | 10000.00 |
| 19. Workshop on Powerful Stress Management Techniques for Improving Life Skills | Skills Development Fund Ltd. | 04 | 18000.00 |
| 20. Exceptional Leadership and Authentic Image Management | Skills Development Fund Ltd. | 01 | 8000.00 |
| 21. Enhancing Skills of Drivers and Minor Employees | Skills Development Fund Ltd. | 01 | 4500.00 |
| 22. Comprehensive Analysis of Corporate Taxation and Value Added Tax (VAT) | Skills Development Fund Ltd. | 01 | 8000.00 |
| 23. Bid Evaluation | Skills Development Fund Ltd. | 01 | 8000.00 |

| පුහුණුවේ නම | පුහුණුව ලැබූ ආයතනය | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | පුහුණු ගාස්තුව (රු.) |
|---|---|---|---|
| 24. Certificate Course in English | Skills Development Fund Ltd. | 04 | 40000.00 |
| 25. යහපාලනය හා නායකත්වය පිළිබඳ ජාතික වැඩමුළුව | ශ්‍රී ලංකා පදනම | 03 | 10500.00 |
| 26. මනා සංවිධානය හා ක්‍රමවත් මිලදී ගැනීම් | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | 02 | 6000.00 |
| 27. Contract payments, files maintenance and contract closeout activities | Skills Development Fund Ltd. | 01 | 4500.00 |
| 28. ශ්‍රම ඵලදායිතා වර්ධනය සඳහා කාර්යාල කළමනාකරණය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 | 9750.00 |
| 29. විනය කාර්යය පටිපාටිය | SDFL | 02 | 16000.00 |
| මුළු එකතුව | | | **935622.50** |

## කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර - 2013

| විස්තරය | සංඛ්‍යාව |
|---|---|
| අනුමත කාර්යය මණ්ඩලය | 79 |
| සේවයේ නියුතු නිලධාරීන් | 68 |
| ස්ථාන මාරුවී ගිය නිලධාරීන් | 07 |
| ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන් | 04 |
| සේවය ස්ථිර කර ඇති නිලධාරීන් | 02 |
| විශ්‍රාම ගිය නිලධාරීන් | 02 |

## සැලසුම් අංශය

# හැඳින්වීම

අමාත්‍යාංශයේ සංවර්ධන කාර්යයන් සැලසුම් කෙරෙන්නේ මෙම අංශය මගින්ය. ඒ අනුව ජාතික අවශ්‍යතාවන් හඳුනා ගනිමින් සංවර්ධන කටයුතු සැලසුම් කෙරෙන අතර එකී සැලසුම් අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ආයතන මගින් දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරේ. 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉලක්ක ළඟා කර ගැනීම සඳහාත් මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව ඉදිරියේදී ළඟා කර ගත යුතු අරමුණු කරා මෙහෙයවමින් සැලසුම් කටයුතු වල නිරත වීම මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

# කාර්යභාරය

- අමාත්‍යාංශයට අදාළ සංවර්ධන සැලසුම් සකස් කිරීමේ කටයුතු.
- ක්‍රියාකාරී සැලැස්මට අනුව අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුව හා ආයතනය සම්බන්ධීකරණය කරගනිමින් මාසික, ත්‍රෛමාසික හා වාර්ෂිකව සමස්ත ප්‍රගතිය ලබාගැනීම හා තොරතුරු විමර්ශනය කර ප්‍රගති සමාලෝචන වාර්තා පිළියෙළ කිරීම හා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු පිළියෙළ කිරීමට සහයවීම හා එම ආයතනය විසින් ක්‍රියාත්මක ව්‍යාපෘති අධීක්ෂණය හා මෙහෙයවීම.
- අමාත්‍යාංශයට අනුබද්ධිත දෙපාර්තමේන්තුවේ සංවර්ධන යෝජනා සැකසීමේදී අවශ්‍ය උපදෙස් ලබාදෙමින් එම යෝජනා මුදල් අමාත්‍යාංශයේ අනුමැතියට ඉදිරිපත් කිරීම.
- මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව ප්‍රගති සමාලෝචනය කිරීමට අවශ්‍ය කාර්යසාධන දර්ශක පිළියෙල කිරීම.
- රු.මි. 50ට වැඩි ව්‍යාපෘති වල ප්‍රගතිය මුදල් අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම.
- අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කරන අවස්ථාවේදී ලබාදීම සඳහා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තා සැකසීම.
- වාර්ෂික කාර්යසාධන වාර්තා සැකසීම.
- ජනාධිපති ලේකම් කාර්යාලයට, මුදල් අමාත්‍යාංශයට, ශ්‍රී ලංකා මහ බැංකුවට, අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවල අවශ්‍යතාවය මත අවශ්‍ය වන තොරතුරු ලබාදීම.
- අමාත්‍යාංශයට අදාළ විෂයයන් පිළිබඳ තොරතුරු රැස්කිරීම හා යාවත්කාලීන කිරීම.

## 2013.12.31. දිනට ප්‍රගතිය

- 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.
- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතනවල කාර්තුමය ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී.
- 2014 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.
- 2014වර්ෂයේ අයවැය සැකසීමට සමගාමීව පැවැත්වූ රැස්වීම් සඳහා සහභාගී වී අවශ්‍ය යෝජනා ලබාදෙන ලදී.
- රු.මි. 50ට වැඩි ව්‍යාපෘති වල ප්‍රගතිය මුදල් අමාත්‍යාංශයට යොමු කොට ඇත.
- අමාත්‍යාංශයේ වැය ශීර්ෂය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අවස්ථාවේදී ලබාදෙන 2013 වර්ෂයේ ප්‍රගතිය හා ඉදිරි වර්ෂයේ වැඩසටහන් ඇතුළත් වාර්තාව සකස්කර ඉදිරිපත් කර ඇත.
- 2013 වර්ෂයේ අම්පාර දිස්ත්‍රික්කයේ පැවති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේ කටයුතු සාර්ථකව නිමකරන ලදී.
- 2013 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව සකසා අවශ්‍ය ආයතන වෙත ලබාදී ඇත.
- 2014 දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන හා ප්‍රදර්ශනය සම්බන්ධ සංවිධාන කටයුතු සිදුකර මින් පවතී.
- ජනාධිපති ලේකම් කාර්යාලයට, මුදල් අමාත්‍යාංශයට, ශ්‍රී ලංකා මහ බැංකුවට , අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට අවශ්‍ය තොරතුරු ලබාදී ඇත.

# සංවර්ධන අංශය

## හැඳින්වීම

මෙම අංශය මගින් වනජීවී සංවර්ධන කටයුතු විධිමත්ව හා ඵලදායීව ක්‍රියාවට නැංවීම සහ අමාත්‍යාංශයේ නඩත්තු කටයුතු මනාව සම්බන්ධීකරණය සිදු කරනු ලබයි.

## කාර්යභාරය

- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී අවශ්‍යවන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම.
- වනජීවී අංශය සම්බන්ධව අමාත්‍යාංශය වෙත ලැබෙන මහජන පැමිණිලි පිළිබඳව අවශ්‍ය කටයුතු කිරීම.
- ජනාධිපති කාර්යාලය වෙත ලැබෙන වනජීවී විෂයට අදාළ මහජන පැමිණිලි පිළිබඳව අවශ්‍ය කටයුතු කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු ඉඩම් පිළිබඳ කටයුතු, ඉඩම් අත්පත්කර ගැනීම් කටයුතු.
- ජාතික වනෝද්‍යාන තුළ සිදුකරන සංවර්ධන කටයුතු, විදුලි වැට ඉදිකිරීම, වන අලි රැඳවුම් මධ්‍යස්ථාන ඉදිකිරීම් කටයුතු සම්බන්ධීකරණය හා අධීක්ෂණය.
- වනජීවී කටයුතු වලට අදාළව සහ මෙම අමාත්‍යාංශයේ විෂය කටයුතු වලට අදාළව වෙනත් අමාත්‍යාංශ මගින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කිරීම.
- වන අලි තර්ජනයට ලක්වන ජනතාව උදෙසා සකස් කරන රක්ෂණ යෝජනා ක්‍රමය සම්බන්ධව ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා සහය වීම.
- ජල සම්පත් කළමනාකරණ කටයුතු පිළිබඳව අදාළ ආයතන සමග එක්ව කටයුතු කිරීම.
- අමාත්‍යාංශයේ සියලුම නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සැකසීම, නිර්දේශ කිරීම සහ ගෙවීම් කටයුතු සඳහා අනුමැතිය ලබාදීම.
- අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ සුළු නඩත්තු කටයුතු අග්‍රිම අත්තිකාරමක් ලබාගෙන සිදු කිරීම.
- අමාත්‍යාංශයේ සියලුම අංශවලට Local Area Net Work පද්ධතිය ක්‍රියාත්මක කරවීම හා අන්තර්ජාල පහසුකම් ලබා දීමට කටයුතු කිරීම.
- අමාත්‍යාංශය සතු වායුසමීකරණ යන්ත්‍ර Fax යන්ත්‍ර ඡායා පිටපත් යන්ත්‍ර සහ පරිගණක යන්ත්‍ර වල නඩත්තු කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සඳහා කටයුතු කිරීම.

## 2013.12.31 දිනට ප්‍රගතිය

- වනජීවී සම්පත් සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළව ලැබුණු මහජන පැමිණිලි 50 ක් සම්බන්ධව කටයුතු කිරීම සඳහා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.
- ජනාධිපති කාර්යාලය වෙත ලැබෙන වනජීවී විෂයට අදාළ මහජල පැමිණිලි 150ක් සම්බන්ධව කටයුතු කිරීම සඳහා අදාළ ආයතන වෙත යොමු කර ඒ සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් සම්බන්ධව පිටස්තර පුද්ගලයන් හා ආයතන අතර පවතින ගැටළු 14 ක් නිරාකරණය කිරීමට කටයුතු සලසා ඇත.
- ජාතික උද්‍යාන තුල වැව් ප්‍රතිසංස්කරණය සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව වැඩ සටහනක් ක්‍රියාත්මක කරවීම හා එහි ප්‍රගති සමාලෝචන කටයුතු සිදු කර ඇත.
- සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය අවස්ථා වල අමාත්‍යාංශයේ සහය ලබා දී ඇත.
- වන අලින්ගෙන් සිදු වන හානි අවම කිරීම සඳහා වන අලි රැඳවුම් මධ්‍යස්ථාන පිහිටුවීම යටතේ හොරොව්පතාන වන අලි රැඳවුම් මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාළව අධීක්ෂණ කටයුතු සිදු කිරීම.
- වනජීවී සංරක්ෂණ විෂය සම්බන්ධව වෙනත් අමාත්‍යාංශ මගින් ඉදිරිපත් කර තිබූ කැබිනට් පත්‍රිකා 10ක් සඳහා නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත.
- වන අලි තර්ජනයට ලක්වන ජනතාව උදෙසා සකස් කරනු ලබන රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව , අයවැය දෙපාර්තමේන්තුව, කෘෂි රක්ෂණ මණ්ඩලය සමග සාකච්ඡා පවත්වමින් අදාළ කටයුතු සම්බන්ධීකරණය කර ඇත.
- ජල සම්පත් කළමනාකරණ කටයුතු පිළිබඳ අදාළ ආයතන මගින් පවත්වනු ලබන රැස්වීම් සහ වැඩමුළුවලට සහභාගී වී ඇත.
- වනජීවී සංරක්ෂණ සම්බන්ධ පොදු කටයුතු සිදු කිරීම.
- වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අදාළ ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සිදුකිරීම.
- මෙම වර්ෂයේදී අමාත්‍යාංශයේ සියළුම නඩත්තු කටයුතු සඳහා වටිනාකම රු. 3,357,039.00ක් වැය කර ඇති අතර ඇස්තමේන්තු සකස් කිරීම, නිර්දේශ කිරීම, ඉදිකිරීම් අධීක්ෂණය හා අදාළ ගෙවීම් කටයුතු සඳහා අනුමැතිය ලබා දීම් යනාදිය සිදු කර ඇත.

- අමාත්‍යාංශ ගොඩනැගිල්ලේ විදුලි පද්ධතිය, ජල සැපයුම් පද්ධතිය, වැසිකිලි පද්ධතිය ඇතුළුව ඉතා කඩිනමින් සිදු කළ යුතු සුළු නඩත්තු සඳහා රු. 50,359.00 ක් වැය කර ඇත.

- මෙම අමාත්‍යාංශයේ කාර්යාල කාමර වල වායුසමීකරණ යන්ත්‍ර 25 ක් සවි කර ඇති අතර, ඒවා වසරකට තුන් වාරයක් සේවා කටයුතු සිදු කරනු ලබයි. සේවා ගිවිසුම් ගත වීම සඳහා මෙම වර්ෂය තුළදී රු. 230,530.00 ක් වැය කර ඇත. මීට අමතරව මෙම යන්ත්‍රවල අළුත්වැඩියා කටයුතු අවශ්‍යා අවස්ථා වල සිදු කර ඇත.

- Fax යන්ත්‍ර 11ක් සේවා කටයුතු සඳහා 2013 වර්ෂයට රු. 40,768.00ක මුදලක් ගෙවා ඇත. වසරකට 4 වතාවක් සේවා කටයුතු ඉටු කරනු ලබයි.

- අමාත්‍යාංශයේ Photocopy යන්ත්‍ර 18 ක් සේවා ගිවිසුම් සඳහා 2013 වර්ෂයේ රු. 146,010.00ක මුදලක් ගෙවා ඇත. වසරකට 4වතාවක් සේවා කටයුතු සඳහා පැමිණෙනු ඇත.

- පරිගණක යන්ත්‍රවල අළුත්වැඩියා කටයුතු අවශ්‍යා අවස්ථා වල සිදු කරනු ලබයි.

- මාසිකව රු. 3085.69 ක මුදලක් වැය කරමින් අමාත්‍යාංශ නිලධාරීන් සඳහා විද්‍යුත් ලිපිනයන් 15 ක් ලබා දෙන ලදී. මේ සඳහා වාර්ෂිකව රු. 20,571.26 ක මුදලක් දරනු ලබයි.

## ගිණුම් අංශය

# හැඳින්වීම

අමාත්‍යාංශයේ ගිණුම් අංශය ප්‍රධාන අංශ 2 කින් සමන්විත වේ. එනම් මුදල් අංශය සහ ගෙවීම් හා ප්‍රසම්පාදන අංශය ලෙසිනි. මුදල් අංශය, වාර්ෂික අයවැය ලේඛන පිළියෙල කිරීම, විසර්ජන ගිණුම පිළියෙල කිරීම, අක්මුදල් අවශ්‍යතා ලබාගැනීම හා භාණ්ඩාගාරය සමඟ අදාළ සම්බන්ධීකරණ කටයුතු ඉටුකරයි. ප්‍රසම්පාදන අංශය අමාත්‍යාංශයේ හා ඒ යටතේ පවත්නා ආයතනවල ප්‍රසම්පාදන කාර්යයන් ඉටුකිරීම, ඒ සම්බන්ධ අධීක්ෂණයන් සිදු කිරීම හා අමාත්‍යාංශයේ සියලුම ගෙවීම් කටයුතු සිදුකරනු ලබයි.

# කාර්යභාරය

- වාර්ෂික විසර්ජන පනතින් බලය ලැබූ වියදම් කළමනාකරණය කිරීම සඳහා මුදල් රෙගුලාසි, අණපනත්, චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කරමින් දෛනික මාසික හා වාර්ෂික ගිණුම් නිසි පරිදි පවත්වාගෙන යාම.
- වත්කම් කළමනාකරණය
- වාර්ෂික වියදම් හා ආදායම් ඇස්තමේන්තු සැකසීම
- අමාත්‍යාංශයට අදාළ වැටුප්, ණය අත්තිකාරම්, පොදු තැන්පත් ඇතුළු සියළුම මූලධන හා පුනරාවර්තන ගෙවීම් කටයුතු ඉටු කිරීම හා වියදම් කළමනාකරණය කිරීම.
- අමාත්‍යාංශයෙහි හා අමාත්‍යාංශය යටතේ පවත්නා දෙපාර්තමේන්තු හා ආයතනවල ප්‍රසම්පාදන කමිටු පත් කිරීම හා ප්‍රසම්පාදන කාර්යයන් ඉටුකිරීම හා අධීක්ෂණය.
- අමාත්‍යාංශය හා ඒ යටතේ පවත්නා ආයතන වලට අදාළ රාජ්‍ය ගිණුම් කාරක සභාව හා රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභා කටයුතු ඉටුකිරීම.
- අමාත්‍යාංශයෙහි මාසික හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම, අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනවල වාර්ෂික ගිණුම් හා වාර්තා අධීක්ෂණය
- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙන් ණය ගෙවීම, ඒවා නිසි පරිදි අය කර ගැනීම, හා ඊට අදාළ ගිණුම් පවත්වා ගැනීම.

# 2013.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය

## වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන
## අමාත්‍ය කාර්යාලය

| විස්තරය | 2013 ඇස්තමේන්තුව (රු.මි.) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.මි.) | 2013.12.31 ට මුළු වියදම (රු.මි.) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| | | | | |
| **පුනරාවර්තන වියදම්** | **22.57** | **24.73** | **24.36** | **99** |
| පුද්ගල පඩි නඩි | 8.70 | 9.08 | 8.93 | 98 |
| ගමන් වියදම් | 1.20 | 1.02 | 0.98 | 96 |
| සැපයීම් | 6.31 | 6.67 | 6.64 | 100 |
| නඩත්තු වියදම් | 3.00 | 4.86 | 4.84 | 100 |
| සේවා | 3.36 | 3.10 | 2.97 | 96 |
| **මූලධන වියදම්** | **4.77** | **16.14** | **15.74** | **98** |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 1.77 | 2.75 | 2.40 | 87 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 3.00 | 13.39 | 13.34 | 100 |
| **මුළු වියදම** | **27.34** | **40.87** | **40.10** | **98** |

## වැඩසටහන 01 - මෙහෙයුම් වැඩසටහන
## ව්‍යාපෘතිය 02 ආයතනික පරිපාලන සේවා

| විස්තරය | 2013 ඇස්තමේන්තුව (රු.මි.) | ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව (රු.මි.) | 2013.12.31 ට මුළු වියදම (රු.මි.) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| | | | | |
| **පුනරාවර්තන වියදම්** | **53.69** | **50.95** | **50.08** | **98** |
| පුද්ගල පඩි නඩි | 32.20 | 30.80 | 30.56 | 99 |
| ගමන් වියදම් | 1.30 | 1.19 | 0.83 | 70 |
| සැපයීම් | 7.31 | 7.82 | 7.80 | 100 |
| නඩත්තු වියදම් | 5.80 | 5.23 | 5.03 | 96 |
| සේවා | 6.08 | 5.31 | 5.28 | 99 |
| රාජ්‍ය ණය පොළී | 1.00 | 0.60 | 0.58 | 97 |
| **මූලධන වියදම්** | **8.88** | **9.41** | **8.12** | **86** |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 2.25 | 2.78 | 1.78 | 64 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 5.63 | 5.63 | 5.39 | 96 |
| හැකියා වර්ධනය | 1.00 | 1.00 | 0.95 | 95 |
| **මුළු වියදම** | **62.57** | **60.36** | **58.20** | **96** |

# අභ්‍යන්තර විගණන අංශය

## හැඳින්වීම

වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය හා එයට අනුබද්ධ , වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ඊට අදාළ අධ්‍යක්ෂ කාර්යාල, අඩවි කාර්යාල , බිට්ටු කාර්යාල යන ආයතන වල අරමුණු හා කාර්යභාරය ඉටු කිරීම සඳහා උපයෝගී කර ගන්නා සම්පත් මනා කළමණාකාරීත්වයකින් හා රජයේ අණපනත්, චක්‍ර ලේඛ, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහ විධි විධාන වලට අනුකූලව සිදු වන්නේ ද යන්න පරීක්ෂා කර බලා ඒ පිළිබඳව නිරීක්ෂණ හා නිර්දේශ යෝජ්‍ය කළමණාකාරීත්වයට ඉදිරිපත් කිරීම අභ්‍යන්තර විගණනයේ අරමුණු වේ.

## කාර්යභාරය

- අමාත්‍යාංශය හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී භාරයෙහි අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දීම හා විධිමත් කිරීම.
- අභ්‍යන්තර විගණන පරීක්ෂණ මඟින් ආයතන කටයුතු, මූල්‍ය කළමනාකරණ කටයුතු මෙහෙය වීම.
- විගණන කළමනාකරණ කමිටු රැස්වීම් මඟින් අමාත්‍යාංශය හා එයට අනුබද්ධ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී භාරයෙහි ඉහළ කළමනාකාරීත්වයට සහය වීම.
- අමාත්‍යාංශය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වනජීවී භාරයෙහි අභ්‍යන්තර විගණන කටයුතු පැවැත්වීම තුළින් මනා මූල්‍ය කළමනාකාරීත්වය පවත්වාගෙන යාම හා රජයේ විගණනයට සහය වීම.
- රජයේ සම්පත් උපයෝගී කර ගැනීමේ දී රජයේ අණපනත් මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහ විධිවිධාන වලට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න පරීක්ෂා කර නිර්දේශ ඉදිරිපත් කිරීම.

## 2013.12.31 දිනට ප්‍රගතිය

- වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ දෛනික ධාවන සටහන් පරීක්ෂා කිරීම.
- උඩවලව ජාතික උද්‍යාන හා ඇත් අතුරු සෙවණ විගණන පරීක්ෂාව.
- දකුණ - ඌව සහකාර අධ්‍යක්ෂ කාර්යාල හා එම කාර්යාල වලට අයත් අඩවි කාර්යාල, බීට්ටු කාර්යාල විගණන පරීක්ෂාව.
- මධ්‍යම කලාපය සහකාර අධ්‍යක්ෂ කාර්යාලය, හෝර්ටන් තැන්න ජාතික උද්‍යානය , අඩවි ආරක්ෂක කාර්යාලය විගණන පරීක්ෂාව.
- පොළොන්නරු කලාපය සහකාර අධ්‍යක්ෂ කාර්යාලය, ජාතික උද්‍යානය, බීට්ටු කාර්යාල හා අඩවි ආරක්ෂක කාර්යාලය විගණන පරීක්ෂාව.
- අනුරාධපුර කලාපය සහකාර අධ්‍යක්ෂ කාර්යාලය , විල්පත්තු ජාතික වනෝද්‍යානය , මූලස්ථාන කාර්යාලය ඉදිකිරීම් පරීක්ෂාව.

# නීති අංශය

## කාර්යභාරය

වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන වන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා වනජීවී භාරය යන ආයතන සම්බන්ධව අමාත්‍යාංශය ඉටුකළ යුතු නීති කටයුතු අධීක්ෂණය කිරීම නීති අංශය විසින් සිදු කරනු ලබයි.

- 1937 අංක 07 දරණ වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත (469 වන අධිකාරිය) ක්‍රියාත්මක කිරීම මගින් සිදු කරනු ලබයි.

තවද මෙම පනත ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා එම පනත සඳහා අවශ්‍ය වන්නාවූ රෙගුලාසි, නියෝග හා සංශෝධන සකස් කිරීම සඳහා උපදේශාත්මක සේවාවන් ඉටුකිරීමත්, එම සංශෝධන නීති කෙටුම්පත් සම්පාදක වෙත ඉදිරිපත් කිරීමත් සිදුකරනු ලබයි.

තත්කාලයේ බල පවත්නා ජාතික වනජීවී ප්‍රතිපත්ති හා නීතිය ඵලදායීව ක්‍රියාත්මක කිරීම වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ කාර්යයන් වන අතර, ඒ සඳහා පනතේ විධි විධාන යටතේ නියෝග සහ රෙගුලාසි සම්පාදනය කිරීමේ කටයුතු දෙපාර්තමේන්තුවේද සහාය ඇතිව සිදු කරනු ලබයි.

එමෙන්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව නීතිමය කටයුතු සම්බන්ධව ගන්නා ක්‍රියාමාර්ග විධිමත්ව සිදු නොවන අවස්ථා පිළිබඳව, අමාත්‍යාංශය වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධව විමර්ශනයන් සිදුකර උපදෙස් ලබා දීම සිදු කරනු ලබයි.

එමෙන්ම අමාත්‍යාංශයට එරෙහිව හා අමාත්‍යාංශය වෙනුවෙන් ද යටතේ ගැනෙන දෙපාර්තමේන්තුව සහ වනජීවී භාරය යන ආයතනවල නඩු, ගිවිසුම්, නීති උපදෙස් හා අධිකරණ කටයුතුවලට අදාළ අනෙකුත් සියලු නඩු කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණ කටයුතු නීති අංශය විසින් සිදුකරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ දීප ව්‍යාප්ත වැටලීම් කටයුතු සම්බන්ධ මාසික සංක්ෂිප්ත වාර්තා කලාප මට්ටමින් ලබා ගෙන එම වැටලීම් වලට අදාළ නඩු කටයුතු සහ ඒවායේ තීන්දු සැලකිල්ලට ගනිමින් සමස්ථ වැටලීම් සමාලෝචනය කිරීම ද මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

# වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

# වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව



## හැඳින්වීම

ශ්‍රී ලංකාවට ඉතා විශාල ජෛව විවිධත්වයක් උරුම වී තිබෙන ශාක සහ සත්ත්ව ප්‍රජාවන්ගෙන් ගහණ වූ පරිසර පද්ධතීන් ආරක්ෂා කරගැනීමෙහි මූලික වගකීම පැවරී ඇත්තේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට වේ. 1949 වර්ෂයේ දී ආරම්භ කරන ලද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙහි මූලික කාර්යභාරය වන්නේ ශ්‍රී ලංකාව තුළ වනජීවී සම්පත් සංරක්ෂණය කිරීමයි. ඒ අනුව ශ්‍රී ලංකාවෙහි සියලුම ප්‍රධාන ගංගාවන්ගේ මූලාශ්‍රයන් මෙන්ම කෘෂිකර්මාන්තය හා විදුලිය ජනනය සඳහා ජලය සපයන මහා පරිමාණ ජලාශයන් ඇතුළු ජලාශ 40 ක පෝෂක ප්‍රදේශයන් ආරක්ෂාව ලබන්නේ වනජීවී රක්ෂිත ජාලය තුළ ය. දිවයිනෙහි මුලු බිම් ප්‍රමාණයෙන් 13%ක් ඉක්මවන එම වනජීවී රක්ෂිත ජාලය කළමනාකරණය කිරීමෙහි වගකීම දරන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි. එම වනජීවී රක්ෂිත ජාලය විවිධ සංරක්ෂණ මට්ටම් යටතේ ප්‍රකාශයට පත් කරන ලද වනජීවී රක්ෂිත වලින් සමන්විතය.

## දැක්ම

‘‘ වර්තමාන හා ඉදිරි පරම්පරාවන් උදෙසා වනජීවී සම්පත් දිගුකාලීනව සංරක්‍ෂණය කිරීම .’’

## මෙහෙවර

‘‘ සියල්ලන් හා එක්ව වෘත්තීයමය කළමනාකරණයක් මගින් වනජීවී සම්පත්වල සංරක්‍ෂණය සහතික කිරීම .’’

## කාර්යභාරය

- සියලුම භූගෝලීය, දේශගුණික හා ජෛව කලාප තුළ වනජීවී සම්පත්වල ප්‍රමාණවත් නියැදි ආවරණය වන පරිදි ශ්‍රී ලංකාවේ වනජීවී රක්ෂිත ජාලය ස්ථාපිත කිරීම මඟින් ඒවායේ දිගුකාලීන පැවැත්ම තහවුරු කිරීම.

- කෘෂිකර්මාන්තය හා ජල විදුලිය නිපදවීම සඳහා ජලය සපයන මහාපරිමාණ ජලාශයන්ගේ ජලපෝෂක ප්‍රදේශ ආරක්ෂාකරගැනීම, ආගමික හා සංස්කෘතික උරුමයන් ආරක්ෂාකර ගැනීම, ආවේණික හා දුලබ වනජීවී විශේෂයන් ආරක්ෂාකර ගැනීම, සුවිශේෂී පරිසර පද්ධතීන් ආරක්ෂා කර ගැනීම වැනි විශේෂිත අරමුණු ඇති වනජීවී රක්ෂිත ප්‍රකාශයට පත් කර වනජීවී රක්ෂිත ජාලය තුළ නිසි ලෙස කළමනාකරණය කිරීම.

- වඳවීමේ තර්ජනයට ලක්ව සිටින දේශීය වනජීවී විශේෂයන් සංරක්ෂණය සඳහා සුදුසු ක්‍රමවේදයන් භාවිත කරමින් විශේෂ ව්‍යාපෘතීන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම මඟින් එම විශේෂයන් ගේ දිගු කාලීන පැවැත්ම සහතික කිරීම.

- වනජීවී රක්ෂිතවලින් බැහැර ප්‍රදේශවල ආරක්ෂිත වනජීවී විශේෂයන් ගේ ආරක්ෂාව තහවුරු කිරීම.

- තත්කාලීනව බලපවත්නා ජාතික වනජීවී ප්‍රතිපත්තිය හා නීතිය ඵලදායීව ක්‍රියාත්මක කිරීම.

- ශ්‍රී ලංකා රජය විසින් අත්සන් තබා ඇති වනජීවී සංරක්ෂණය හා අදාළ, වඳවීමේ තර්ජනයට ලක් වූ ජීවී විශේෂයන් ගේ ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සම්මුතිය (CITES), ජාත්‍යන්තර වැදගත්කමක් ඇති තෙත් බිම් පිළිබඳ සම්මුතිය (Ramsar) හා සංක්‍රමණික වන සත්ත්ව විශේෂයන් ගේ සංරක්ෂණය පිළිබඳ සම්මුතිය (CMS - Bonn) යන ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ලත් අධිකාරි බලය අනුව කටයුතු කිරීම.

- වනජීවී රක්ෂිත ආශ්‍රිතව පාරිසරික සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය මඟින් ජාතික ආර්ථිකයට එයින් ලබාදෙන දායකත්වය ප්‍රශස්ත තලයක පවත්වා ගැනීම.

- වනජීවී සම්පත්වල සංරක්ෂණය හා විද්‍යාත්මක කළමනාකරණයක් සඳහා අවශ්‍ය දත්ත හා තොරතුරු රැස්කර ගැනීමට පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය.

- ස්වභාව සම්පත් සංරක්ෂණය පරමාර්ථය කොටගත් වෙනත් ආයතන සමඟ අන්‍යෝන්‍ය අවබෝධය හා සහයෝගය වර්ධනය කර ගනිමින් සංරක්ෂණ ක්‍රියාදාමය ශක්තිමත් කර ගැනීම.

- සාමාන්‍ය මහජනතාව, රාජ්‍ය නිලධාරීන් හා වෙනත් කණ්ඩායම් අතර වනජීවී සංරක්ෂණ කටයුතු ව්‍යාප්ත කිරීමෙන් ඔවුන්ගේ දායකත්වය ඊට නොඅඩුව ලබා ගැනීම ඉලක්ක කර ගත් වනජීවී සංරක්ෂණ අධ්‍යාපනික වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කිරීම.

- වනජීවී රක්ෂිත තුළ ස්වභාව සම්පත් මත ඒ අවට පදිංචි ජනතාව ගේ යැපීම අවම කර ගැනීම ඉලක්ක කොටගත් සමාජ ආර්ථික සංවර්ධන වැඩ සටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

# සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

## 1. විදුලි වැටවල් ඉදි කිරිම

ගජ මිතුරෝ වැඩසටහන 2012 දී අවසන් වුවද 2013 වසරේදී ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන යටතේ විදුලි වැට ඉදිකිරීම තවදුරටත් සිදු කරනු ඇත.

**අරමුණු**

- අලි-මිනිස් ගැටුම අවම කිරිම
- අලි-මිනිස් ගැටුම අවම කිරීම සඳහා ක්‍රමෝපායන් සංවර්ධනය සහ හැකියා වර්ධනය.





| | | |
|---|---|---|
| **2013 වෙන්කළ ප්‍රතිපාදන** | **-** | **රු.මි. 100.32** |
| **මූල්‍ය ප්‍රගතිය** | **-** | **රු.මි. 110.91** |

**භෞතික ප්‍රගතිය**

- වනඅලි-මිනිස් ගැටුම අවම කිරිම සඳහා ජාතික සැළස්ම සකස් කර අවසන් අදියරේ පවතී.
- කි.මී. 708.5ක් දිග විදුලි වැටවල් සඳහා උපකරණ මිලදී ගෙන සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට භාර දී ඇති අතර විදුලි වැට ඉදි කරමින් පවතී.

## 2. හොරොව්පතාන අලි සංරක්ෂණ උද්‍යානය ඉදිකිරීම

ගම් වදින කරදරකාරි වන අලි, වන අලි සංරක්ෂණ උද්‍යානවලට මුදා හැරීම මගින් අලි-මිනිස් ගැටුම අවම කිරිමේ මුලික අරමුණින් 2012 වසරේ ඒකාබද්ධ අරමුදලේ මුදල් ප්‍රතිපාදන මත මෙය ආරම්භ කරනු ලැබීය.

**අරමුණු**

- අලි-මිනිස් ගැටුම පවතින ප්‍රදේශවල සමාජ-ආර්ථික හානි අවම කිරීම
- වන අලි සංරක්ෂණ උද්‍යාන හරහා පාරිසරික සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම
- වන අලි සංරක්ෂණ උද්‍යාන හරහා ප්‍රදේශයේ ජනතාවට ආදායම් උත්පාදන මාර්ග ඇති කිරීම

**2013 වෙන්කළ ප්‍රතිපාදන - රු.මි. 300.00**

**මූල්‍ය ප්‍රගතිය - රු.මි. 133.86**

**භෞතික ප්‍රගතිය**

- කි.මී. 16 ක් දිග විදුලි වැට ඉදිකිරීම සඳහා මාර්ගය එළිපෙහෙළි කර ඇති අතර සපත්තු පාලම් 22 ක් ඉදිකිරීම සම්පූර්ණ කර ඇත.
- විශේෂයෙන් සැලසුම් කරන ලද විදුලි වැට කොන්ක්‍රීට් කණු 2,100 ක් පමණ ඉදිකර කේබල් යොදා වැට සකස් කර ඇත.
- වැව් 03ක(පුලියන්කුලම,සියඹලාගස් වැව,5 කණුව වැව) ඉදි කිරීම් කටයුතු අවසන් කර ඇත.
- මොටගොල්ලෑව කාර්යාලය සහ නිල නිවාස ගොඩනැගිල්ල ඉදි කිරීම් සම්පූර්ණ කර ඇත.
- කපුගොල්ලෑව කාර්යාලය සහ නිල නිවාසයේ කටයුතු 40% කින් අවසන් කර ඇත.





## 3. දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන

2013 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන ඒකාබද්ධ අරමුදලේ මුදල් ප්‍රතිපාදන මත වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පහත සඳහන් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

- ජාතික වන උද්‍යාන තුළ පාරිසරික සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම
- වනජීවි රක්ෂිත ජාලය තුළ පරිපාලන සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- වනජීවි රක්ෂිත ජාලය පුළුල් කිරීම
- තොරතුරු සන්නිවේදන ජාලය ප්‍රවර්ධනය කිරීම

**2013 වෙන්කළ ප්‍රතිපාදන - රු.මි. 100.0**

**මූල්‍ය ප්‍රගතිය - රු.මි. 98.32**

**භෞතික ප්‍රගතිය**

- 2013 අම්පාර දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය සාර්ථකව නිම කරන ලදී.
- කි.මි. 258 ක් දිග විදුලි වැට සඳහා උපකරණ හා දැවකණු මිල දී ගැනීම අවසන් කර ඇති අතර කි.මි. 77 ක ඉතිරි ඉදිකිරීම් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට භාර දී ඇත.





## 4. මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ සිදුකරන වනජීවී සංරක්ෂණ කටයුතු

මොරගහකන්ද-කළුගග ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ 2008 වසරේ සිට වනජීවී සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව මගින් කළු ගඟ ගංගාධාර ප්‍රදේශයේ පහත අරමුණු උදෙසා වනජීවී සංරක්ෂණ කටයුතු ක්‍රියාවට නංවනු ලබයි.

**අරමුණු**

- කළුගඟ හා යෝජිත මොරගහකන්ද ජලාශය ආශ්‍රිතව ප්‍රේරක කලාපයක් ප්‍රකාශයට පත් කිරීම සහ එහි මිනිස් ක්‍රියාකාරකම් අවම කිරීම.
- ඉහත ප්‍රදේශයේ මිනිස් වනජීවී ගැටුම අවම කිරීම සඳහා වනජීවී බාධක පිහිටුවීම. (විදුලි වැටවල්, අගල් කැපීම ආදිය)
- වනජීවී මිනිස් ගැටුම අවම කිරීම සඳහා ව්‍යාප්තියට යටත් වන ප්‍රදේශයේ වනජීවී වාසස්ථාන දියුණු කිරීම
- ව්‍යාප්ති ප්‍රදේශය ආශ්‍රිත වනජීවී රක්ෂිත ප්‍රදේශවල පාරිසරික සංචාරක කර්මාන්තය දියුණු කිරීම.
- ව්‍යාපෘති ප්‍රදේශය ආශ්‍රිතව වනජීවී රක්ෂිත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

**2013 වෙන්කළ ප්‍රතිපාදන - රු.මි. 41.19**

**මූල්‍ය ප්‍රගතිය - රු.මි. 38.28**

**භෞතික ප්‍රගතිය**

- කි.මී. 136ක් දිග විදුලි වැටවල් ඉදි කිරීම් සඳහා උපකරණ මිල දී ගැනීම සිදු කර ඇති අතර ඉන් කි.මි. 121 ක් ඉදි කිරීම සම්පූර්ණ කර ඇත.
- දැන්වීම් පුවරු 20ක් අළුත්වැඩියාවන් සිදු කරන ලදී.
- වනජීවී සංචාරක බංගලා 04ක අලුත්වැඩියාවන් සිදු කරන ලදී.
- කි.මි. 22ක් දිගට රක්ෂිත ප්‍රදේශවල පාරවල් දෙපස යටිරෝපණ ඉවත් කරන ලදී.
- වස්ගමුව ජාතික උද්‍යානයේ වැව් 03 ක් ප්‍රතිසංස්කරණය කර ඇත.

## වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද අනෙකුත් වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය (2013.12.31 දිනට)

| අනු අංක | වැඩසටහන් | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1. | **රක්ෂිත ප්‍රදේශ ජාලය ස්ථාපිත කිරීම.**<br><br>මධුපාර අභයභූමියේ දැන්වීම් පුවරුව<br><br>වුණුඩිකුළම් අභයභූමියේ දැන්වීම් පුවරුව | **5.0** | **4.98** | • සෝමාවතිය ජාතික උද්‍යානයේ මායිම් කණු 600 ක්, මාදු ගඟ අභයභූමියේ මායිම් කණු 75ක් සහ තබ්බෝව අභයභූමියේ කි.මී. 5 ක මායිම් ස්ථාපිත කිරීම සිදු කර ඇත.<br>• රක්ෂිත ප්‍රදේශවල නාම පුවරු 127 ක් ස්ථාපනය කර අවසන් කර ඇත.<br>• නාම පුවරු 9ක් ප්‍රතිසංස්කරණය කිරීම සිදු කරමින් පවතී. |
| 2. | **පාරිසරික සංචාරක කටයුතු සංවර්ධනය.**<br><br>මින්නේරිය ජාතික උද්‍යානය<br><br>එග්ගල්ඔය වනජීවි සංචාරක බංගලාව | **10.00** | **10.58** | • වුණ්ඩිකුළම් වනජීවි සංචාරක බංගලාව සඳහා ගෘහ උපකරණ මිල දී ගැනීම අවසන් කර ඇත.<br>• වනජීවි සංචාරක බංගලා 06ක්, කුමන විල්ලුවේ නැරඹුම් කුළුනක් ඉදි කිරීම සහ සංචාරක මධ්‍යස්ථාන 02ක පහසුකම් වැඩි දියුණු කිරීම සහ කුමන ජාතික උද්‍යානයේ කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථානය ඉදි කිරීම සිදු කරන ලදී.<br>• අන්තර්ජාලය මගින් වනජීවි සංචාරක බංගලා වෙන් කිරීමේ ව්‍යාපෘතිය සිදු කරමින් පවතී. |

| අනු අංක | වැඩසටහන් | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 3. | **ජනවිඥුම්කරණ වැඩසටහන.**<br><br>ජීව වැටක්<br><br>සවිය කාන්තා වැඩසටහන යටතේ අත්කම් භාණ්ඩ | **1.50** | **1.15** | • රක්ෂිත ප්‍රදේශ අවට ජනතාවගේ සහභාගීත්වයෙන් ශ්‍රමදාන වැඩසටහන් 02ක්, ප්‍රජා මූල සංවිධානයන්හි ප්‍රගති සමාලෝචනය කිරීමේ වැඩසටහන් 03ක්, ස්වයං රැකියා ප්‍රවර්ධන පුහුණු වැඩසටහන් 03 ක් සහ සවිය කාන්තා ප්‍රදර්ශන වැඩසටහන සාර්ථකව පවත්වා අවසන් කර ඇත.<br>• කුමන ජාතික උද්‍යානයේ කඩොලාන පැල 3000 ක් ප්‍රජාවගේ සහභාගීත්වයෙන් රෝපණය කිරීම අවසන් කර ඇති අතර රක්ෂිත ප්‍රදේශ අවට ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා ස්වයං රැකියා පුහුණු වැඩසටහන් 02 ක් පවත්වා අවසන්ය.<br>• ග්‍රාමීය ප්‍රජාවගේ සහභාගීත්වයෙන් ජීව වැට ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම සඳහා වැඩසටහන් 04 ක් පවත්වා කි.මී 11 ක කටයුතු සිදු කර ඇත.<br>• කවුඩුල්ල කෘෂි ළිඳක් සාදා නිමකර ඇත. ගෝනගම්ආර ක්ෂුද්‍ර සැලසුම මගින් හඳුනාගත් ව්‍යාපෘතියක් වන බිම්මල් වගාව සාර්ථකව අවසන් කර ඇත.<br>• විල්පත්තුව/ඇලපත්ගම ගම්මානයේ ක්ෂුද්‍ර සැලසුම සකස් කිරීම කර අවසන්ය. |

| අනු අංක | වැඩසටහන් | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **4.** | **තර්ජනයට ලක් වූ ජීවීන් සංරක්ෂණය.**<br>වනජීවීන්ට ප්‍රතිකාර කිරීම<br><br> | **2.50** | **2.39** | • අනාථ සහ විවිධ අනතුරුවලට පත් වූ සතුන්ට ප්‍රතිකාර කිරීම සහ ඔවුන් ස්වාභාවික පරිසරයට මුදාහරින තෙක් රඳවා තබා ගැනීම සඳහා විවිධ ප්‍රමාණයේ සත්ත්ව කූඩු 20 ක් නිෂ්පාදනය කරනු ලැබීය.<br>• හොරගොල්ල ජාතික උද්‍යානයේ රෝගී වූ සතුන්ට ප්‍රතිකාර කිරීම සඳහා සත්ත්ව කොටුවක් සකස් කර අවසන් කර ඇත.<br>• සතුන් ඇල්ලීම සඳහා ආම්පන්න මිළ දී ගෙන ඇත.<br>• උඩවලව ඇත් අතුරුසෙවනේ පස් කන්දක් ඉදි කිරීම. |
| **5.** | **තොරතුරු හා සන්නිවේදන පද්ධතිය වැඩිදියුණු කිරීම.**<br><br> | **4.00** | **3.15** | • ප්‍රධාන කාර්යාලය සහ ක්ෂේත්‍ර කාර්යාල සඳහා ගුවන් කථන යන්ත්‍ර සඳහා බැටරි 60 ක් මිල දී ගන්නා ලදී.<br>• ජාතික උද්‍යානයන් වල ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම පරිගණක ගත කිරීමේ ක්‍රියාවලිය සහ දෙපාර්තමේන්තුවේ පරිගණක ජාලය සහ ගුවන් විදුලි සන්නිවේදන ජාලය නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම යටතේ පරිගණක 100 ක් සඳහා ප්‍රති වෛරස් මෘදුකාංග ලබාදීම හා නව පරිගණක 10ක් මිල දී ගෙන ඇත. |
| **6.** | **මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය**<br> | **20.00** | **13.59** | • කුමන සහ උඩවලව ජාතික උද්‍යානවල කි.මී.15 ක් දිග මාර්ග පද්ධතියක් වැඩි දියුණු කිරීම සිදු කර ඇති අතර ජාතික උද්‍යානවල වල කි.මී. 68 ක් දිග මාර්ග පද්ධතියක් වැඩි දියුණු කර ඇත.<br>• වස්ගමුව සහ විල්පත්තු ජාතික උද්‍යානවල කි.මී.5ක් දිග මාර්ග අළුතින් ඉදි කරමින් පවතී. |

| අනු අංක | වැඩසටහන් | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 7. | **ජලාශ හා දියවලවල් ප්‍රතිසංස්කරණය කිරීම**   | 2.00 | 6.52 | • විල්පත්තුව ජාතික උද්‍යානයේ වැව් 01ක් ප්‍රතිසංස්කරණය සිදු කර ඇත. අනෙකුත් රක්ෂිත ප්‍රදේශවල වැව් 19ක් ප්‍රතිසංස්කරණය කර ඇත.<br>• වැව් 09 ක් හා දියවලවල් 15 ක් ඉදිකර ඇත |
| 8. | **ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම**  වව්නියාව වනජීවී පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම | 25.33 | 20.93 | • රක්ෂිත ප්‍රදේශවල පරිපාලන ගොඩනැගිලි සහ නිල නිවාස ඇතුළුව ගොඩනැගිලි 31 ක ප්‍රතිසංස්කරණය කිරීම අවසන් කර ඇත.<br>• ජල සැපයුම් පද්ධතියක් ස්ථාපනය කර ඇත. |
| 9. | **ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම**  වනජීවී සංචාරක නිවාසය සඳහා මිල දී ගත් ගෘහ භාණ්ඩ | 5.64 | 5.64 | • ප්‍රධාන කාර්යාලයට සහ ක්ෂේත්‍ර කාර්යාලයන් සඳහා පරිගණක 10ක් මුදල් ගණක යන්ත්‍ර 05ක්, සහ ශීතකරණ 04ක් ඡායා පිටපත් යන්ත්‍ර 02ක් රූපවාහිනී 01ක් සහ මල්ටි මීඩියා යන්ත්‍ර 03 ක් හා මේසයක් මිල දී ගැනීම සිදු කරනු ලැබිය.<br>• ලිපිකරුවන් සඳහා අවශ්‍ය මේස පුටු, අල්මාරි ඇතුළුව අනෙකුත් අවශ්‍ය කරන දෑ මිළ දී ගැනීම. |

| අනු අංක | වැඩසටහන් | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **10.** | **වාසස්ථාන සුපෝෂණය**<br><br>ලුණුගම්වෙහෙර ජාතික උද්‍යානයේ වාසස්ථාන සුපෝෂණය | **35.00** | **30.06** | • උඩවලව හා ලුණුගම්වෙහෙර ජා.උද්‍යානවල වාසස්ථාන සුපෝෂණය යටතේ පිලිවෙලින් අධිගණත්ව ලැන්ටානා හෙක්. 84ක හා 77ක ආක්‍රමණශීලී ශාක ඉවත් තරනු ලැබීය. තවද එම උද්‍යානවල පිලිවෙලින් හෙක්ටාර් 38ක හා 27ක නඩත්තු කටයුතු සිදු කරන ලදී.<br>• යාල ජාතික උද්‍යානයේ හෙක්. 89ක තෘණ භූමි නඩත්තු සිදු කරනු ලැබීය.<br>• වැව් 08ක් ප්‍රතිසංස්කරනය කර නිම ඇති අතර 02ක වැඩ සිදුකරමින් පවතී. තවද කුඩා දියවලවල් 20ක් (විල්පත්තුව,ඩෙල්ෆ් දූපත,කුඩුම්බිගල) ප්‍රතිසංස්කරණය කර ඇත.<br>• ගිනි කළමනාකරණය මගින් විල්පත්තු ජා.උ හෙක්. 100ක තෘණ භූමි නඩත්තු කිරීම හා හෙක්. 52.5 ක තෘණ භූමි එළි කිරීම සිදු කරන ලදී.<br>• කි.මි. 30ක ගිනිපටි කපන ලදී. |
| **11.** | **යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම** | **4.1** | **2.78** | • කුමන ජාතික උද්‍යානය සඳහා සූර්ය බල පද්ධති 01ක්, සහ ගල්ඔය සහ වස්ගමුව ජාතික උද්‍යාන සඳහා වතුර මෝටර් 02 ක් මිල දී ගන්නා ලදී.<br>• කල්පිටිය සමුද්‍ර උද්‍යානය සඳහා බෝට්ටුවක් මිළ දී ගැනීම. |

| අනු අංක | වැඩසටහන් | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| 12. | **පුහුණු හා පර්යේෂණ**<br><br><br>ගිනි අවි පුහුණුව පිළිබඳව පුහුණු පාඨමාලාව- මහඔය පොලිස් විශේෂ කාර්ය බලකාය | 1.30 | 0.62 | • වනජීවි නිලධාරීන් සඳහා GPS තාක්ෂණය, සමණලයින් හඳුනාගැනීම සඳහා වැඩමුළු 01ක්, මිරිදිය මසුන් හඳුනාගැනීම සඳහා වැඩමුළු 01ක් පවත්වා ඇත.<br>• බංගලා භාරකරුවන් සඳහා පුහුණු වැඩසටහන් අවසන් කර ඇත.<br>• පර්යේෂණ කමිටු 04ක් පවත්වා ඇති අතර දෙපාර්තමේන්තුව විසින් ද පර්යේෂණ 10ක් සිදු කරමින් පවතී.<br>• වනඅලි මිනිස් ගැටුම අවම කිරීම සඳහා ජාතික සැලස්ම පිළියෙල කර අවසන් කර ඇත. |
| 13. | **සංරක්ෂණ අධ්‍යාපනය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම** | 4.70 | 4.07 | • ලෝක පරිසර දිනය, ජෛව විවිධත්ව දිනය, තෙත් බිම් දිනය සැමරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 10ක් වනජීවි කලාප වල පැවත් විය.<br>• පොසොන් සහ ඇසළ උත්සව වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 04ක් පැවත් විය.<br>• පාසල් ළමුන්, රාජ්‍ය නිලධාරීන් ඇතුළුව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 77ක් හා ප්‍රදර්ශන වැඩසටහන් 15 ක් පවත්වා ඇත.<br>• යාත්‍රා වැඩසටහනට සමගාමීව ශ්‍රමදාන වැඩසටහනක් අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල පවත්වා ඇත.<br>• වනාන්තරේ කතන්දරේ වැඩසටහන් 40ක් ගුවන් විදුලි සංස්ථාව මගින් ප්‍රචාරය කරන ලද අතර වනජීවි සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය මගින් පළ කරන වනදිවි සැරිය නම් පුවත්පත පළ කිරීම සඳහා දායකත්වය සපයන ලදී.<br>• 2012 වනජීවි සඟරාවේ පිටපත් 2,000ක් මුද්‍රණය කර නිකුත් කරන ලදී.<br>• තෙත් බිම් දිනය, ජෛව විවිධත්ව දිනයන් සැමරීම සහ වන අලින් ගම් වැදීම වැළක්වීම සඳහා ඉදි කළ විදුලි වැට සම්බන්ධයෙන් කෙටි වාර්තා වැඩ සටහන් 03ක් නිෂ්පාදනය කරන ලදී. |

| අනු අං ක | වැඩසටහන් | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|
| **14.** | **ආරක්ෂාව හා නීතිය ක්‍රියාත්මක කිරීම.**<br>වනජීවි නිලධාරින් මුර සංචාරයක් අතර මග...<br><br> | **5.00** | **3.90** | • ගිණි අවි සඳහා පතොරම් 5,000 ක් මිල දී ගැනීම සහ මුහුදු ක්ෂීරපායීන් පිළිබඳව ගැසට් නිවේදනය (පිටපත් 750) භාෂා 03න් ම මුද්‍රණය කිරීම අවසන් කරන ලදී.<br>• ගිණි අවි භාවිතය පිළිබඳව පුහුණු වැඩසටහන් 01ක් සහ වනජීවී නීතිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 01ක් පවත්වනු ලැබීය.<br>• GPS හා චන්ද්‍රිකා ඡායාරූප භාවිතයෙන් නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව දෙපාර්තමේන්තු නිලධාරින් 50ක් දැනුවත් කිරීම සඳහා වැඩමුළු 02 පවත් වන ලදී. |
| **15.** | **ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය පවත්වාගෙන යාම.**<br><br>ජාතික වනජීවි පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය - ගිරිතලේ | **9.00** | **11.16** | • වනජීවි කළමනාකරණය පිළිබඳව ජ්‍යෙෂ්ඨ හා කණිෂ්ඨ සහතික පත්‍ර පාඨමාලාවන් 02ක් ගිරිතලේ ජාතික වනජීවි පුහුණු හා පර්යේෂණ කේන්ද්‍රයේ දී වනජීවී නිලධාරීන්ගේ හැකියා වර්ධනය සඳහා පවත් වනු ලැබීය.<br>• රාජ්‍ය නිලධාරීන් සහ දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීමේ කෙටිකාලීන වැඩසටහන් 08ක් පවත්වනු ලැබීය. |
| **16.** | **වාහන අළුත්වැඩියාව.** | **7.50** | **5.13** | • දෙපාර්තමේන්තුවේ සහ ක්ෂේත්‍ර කාර්යාලවල වාහන 19ක් අළුත්වැඩියා කර අවසන් අතර KA –0593 ටිපර් රථය ද අළුත්වැඩියා කර ඇත. |

## වනජීවී සංරක්ෂණ අරමුදල

වනජීවී සංරක්ෂණ අරමුදල ස්ථාපිත කර ඇත්තේ වනසත්ත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේය. මෙම අරමුදලේ අරමුණ වන්නේ වනජීවී සංරක්ෂණ කටයුතු වලින් ලැබෙන ආදායම් වලින් කොටසක් වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා යොදාගැනීමය. මෙම අරමුදලේ ආදායම් ලෙස සංචාරක කටයුතු වලින් ලැබෙන ආදායමින් කොටසක්, වනජීවී අපරාධ වලට එරෙහි නීතිමය කටයුතු වලින් ලැබෙන දඩ මුදල්, දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන වෙනත් සේවා වලින් ලැබෙන ආදයම් හා පරිත්‍යාග ද ඇතුළත් වේ.

## වනජීවී සංරක්ෂණ අරමුදලේ ප්‍රගතිය (2013.12.31දිනට )

| මුල්‍ය ප්‍රභවය | ඇස්තමේන්තුව (රු. මි.) | වියදම (රු. මි.) | (%) |
|---|---|---|---|
| වනජීවී සංරක්ෂණ අරමුදල | 799.40 | 412.00 | 51 |

### සංචාරක සේවා සැපයීමෙන් ලත් ආදායම (2013.12.31දිනට)

| මාසය | ආදායම (රු.මි.) |
|---|---|
| ජනවාරි | 78.43 |
| පෙබරවාරි | 91.00 |
| මාර්තු | 81.88 |
| අප්‍රේල් | 57.53 |
| මැයි | 32.11 |
| ජූනි | 32.94 |
| ජූලි | 86.15 |
| අගෝස්තු | 138.79 |
| සැප්තැම්බර් | 60.31 |
| ඔක්තෝබර් | 70.07 |
| නොවැම්බර් | 77.96 |
| දෙසැම්බර් | 108.77 |
| **එකතුව** | **915.94** |

### ජාතික උද්‍යානවලට සංචාරකයින්ගේ පැමිණීම (2013.12.31 දිනට)

| ජාතික උද්‍යානය | දේශීය | විදේශීය |
|---|---|---|
| යාල | 236,700 | 142,714 |
| හෝටන් තැන්න | 170,966 | 48,827 |
| උඩවලව | 70,927 | 41,487 |
| වස්ගමුව | 20,402 | 934 |
| මින්නේරිය | 46,511 | 34,065 |
| බුන්දල | 9,124 | 6,947 |
| හොරගොල්ල | 6,737 | 9 |
| කවුඩුල්ල | 20,539 | 15,775 |
| ලුණුගම්වෙහෙර | 4,101 | 740 |
| ගල්ඔය | 2,626 | 165 |
| කුමණ | 14,027 | 3,105 |
| අංගම්මැඩිල්ල | 1,358 | 0 |
| ගැල්වේස්ලෑන්ඩ් | 1,730 | 154 |
| විල්පත්තු | 37,705 | 8,846 |
| මදුරුඔය | 1,084 | 29 |
| ලාහුගල | 243 | 59 |
| පරෙවි දූපත් | 38,978 | 12,886 |
| හික්කඩුව | 26,817 | 5,968 |
| උඩවලව ඇත් අතුරු සෙවන | 125,588 | 16,074 |
| වැලිපර අභයභූමිය | 8,494 | 2,443 |
| **එකතුව** | **844,657** | **341,227** |

## සමස්ත මූල්‍ය ප්‍රගතිය (2013.12.31 දිනට)

| වියදම් කාණ්ඩය | ඇස්තමේන්තුව (රු.මි.) | වියදම (රු. මි.) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| මූලධන වියදම් | 642.9 | 469.74 | 73 |
| පුනරාවර්තන වියදම් | 531.6 | 527.08 | 99 |
| **එකතුව** | **1,174.5** | **996.82** | **85** |

| අනු අංකය | වැඩසටහන | ප්‍රතිපාදන (රු.මි.) | ප්‍රගතිය |
|---|---|---|---|
| | | | මූල්‍ය (රු.මි.) |
| 1 | රක්ෂිත ප්‍රදේශ ජාලය ස්ථාපනය කිරීම | 5.00 | 4.98 |
| 2 | පාරිසරික සංචාරක කටයුතු සංවර්ධනය | 10.00 | 10.58 |
| 3 | ජනවිහිදුම්කරණ කටයුතු සංවර්ධනය | 1.50 | 1.15 |
| 4 | තර්ජනයට ලක් වූ ජීවීන් විශේෂ සංරක්ෂණය | 2.50 | 2.39 |
| 5 | තොරතුරු සන්නිවේදන පද්ධති වැඩිදියුණු කිරීම | 4.00 | 3.15 |
| 6 | රක්ෂිත ප්‍රදේශවල මාර්ග පද්ධතිය ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය කිරීම | 20.00 | 13.59 |
| 7 | රක්ෂිත ප්‍රදේශවල ජල ප්‍රභවයන් වැඩිදියුණු කිරීම | 2.00 | 6.52 |
| 8 | ගොඩනැගිලි හා ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය | 25.33 | 20.93 |
| 9 | විදුලි වැට ඉදිකිරීම | 100.32 | 110.91 |
| 10 | රක්ෂිත ප්‍රදේශවල වාසස්ථාන සුපෝෂණය | 35.00 | 30.06 |
| 11 | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 5.64 | 5.64 |
| 12 | යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම | 4.1 | 2.78 |
| 13 | වාහන අළුත්වැඩියාව | 7.50 | 5.13 |
| 14 | පුහුණු හා පර්යේෂණ කටයුතු, | 1.30 | 0.62 |
| 15 | සංරක්ෂණ අධ්‍යයනය හා විවරණය, | 4.70 | 4.07 |
| 16 | ආරක්ෂාව සහ නීති ක්‍රියාත්මක කිරීම, | 5.00 | 3.90 |
| 17 | ජාතික වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රය පවත්වාගෙන යාම, | 9.00 | 11.16 |
| 18 | හොරොව්පතාන වනඅලි සංරක්ෂණ උද්‍යානය ස්ථාපිත කිරීම | 300.00 | 133.86 |
| 19 | දැයට කිරුළ සංවර්ධන වැඩසටහන | 100.00 | 98.32 |
| | **එකතුව** | **642.9** | **469.74** |

# ශ්‍රී ලංකා වනජීවී භාරය

# ශ්‍රී ලංකා වනජීවී භාරය

## අරමුණු

- ශ්‍රී ලංකාවේ ස්වාභාවික උරුමයන්හි පාරිසරික හා ආර්ථික අගයන් ආරක්ෂා කිරීම හා වර්ධනය කිරීම
- වනජීවී හා පාරිසරික අධ්‍යාපනික කටයුතු ප්‍රචලිත කිරීම
- ශ්‍රී ලංකාවේ වනජීවී සංරක්ෂණ කටයුතු සඳහා සහාය වීම
- සංරක්ෂිත කලාප ආශ්‍රිතව ප්‍රජා සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය පියවර ගැනීම
- වනජීවී/ පාරිසරික නීති අවශ්‍ය පරිදි ප්‍රචලිත කිරීම
- පාරිසරික සංචාරක පහසුකම්, සන්නිවේදන කාර්යභාරයන් පවත්වාගෙන යාම හා සංවිධානය කිරීම
- ශ්‍රී ලංකාවේ ස්වාභාවික හා සංස්කෘතික අගයන් පිළිබඳ ජාතික හා ජාත්‍යන්තර අවබෝධය වැඩිදියුණු කිරීම

## පරිපාලනය

වනජීවී භාරය පාලනය කරනු ලබන්නේ සාමාජිකයන් 10 දෙනෙකුගෙන් යුත් භාරකාර මණ්ඩලයක් මගිනි. මෙහි සංයුතිය වනුයේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් නිල වශයෙන් සභාපති වශයෙන්ද, වනජීවී විෂය භාර අමාත්‍යාංශ ලේකම්තුමා, වන සංරක්ෂණ ජනරාල්, මුදල් අමාත්‍යාංශ නියෝජිත, ලංකා සංචාරක මණ්ඩල නියෝජිත, මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිත, රාජ්‍ය නොවන ආයතන නියෝජිතයන් දෙදෙනෙකු හා පෞද්ගලික ව්‍යාපාරික අංශයෙන් දෙදෙනෙකු වශයෙනි.

### වනජීවී භාරයේ ආදායම් මාර්ග

වනජීවී භාරය සිය සියලු කාර්යයන් සඳහා ආදායම් ඉපයීම කළ යුතු වේ. මේ සඳහා දැනට ප්‍රධාන ආදයම් මාර්ග 4ක් හඳුනාගෙන ඇත.

- අරමුදල් ආයෝජනය
- රන්දෙණිගල පුහුණු මධ්‍යස්ථානයේ පහසුකම් කුලියට දීම
- පාරිසරික සංචාරක කටයුතු
- අලෙවි කටයුතු (සන්නිවේදන භාණ්ඩ ආදිය)

සංරක්ෂණ සේවාවන් වර්ධනය කිරීම වනජීවී භාරයෙහි වාර්ෂික ආදායම් වර්ධනය සමග බැඳී පවතී.

## වනජීවී භාරයේ වැඩසටහන් හා සේවාවන්

වනජීවී භාරය තම වාර්ෂික ආදායමෙන් 50%ක් පමණ විවිධ වූ සංරක්ෂණ සේවාවන් පවත්වාගෙන යාම සඳහා වැය කරනු ලබයි.

- **ප්‍රජා අධ්‍යාපන වැඩසටහන්**

  මේ යටතේ ජංගම දැනුවත් කිරීමේ වැඩසටහන්, වැඩමුළු, ගවේෂණ චාරිකා, එක්දින දැනුවත් කිරීමේ වැඩමුළු, තෙදින නේවාසික ගවේෂණ චාරිකා හා සයමාසික වනජීවී සංරක්ෂණ සහතික පත්‍ර පාඨමාලා ආදිය ඇතුළත් වේ. මෙයට අමතරව විවිධ දැනුවත් කිරීමේ වැඩසටහන් ද වනජීවී භාරය මගින් සංවිධානය කෙරේ.

- **පාසල් අධ්‍යාපනික වැඩසටහන් හා පාරිසරික කටයුතු**

  මෙම වැඩසටහන වනජීවී භාරයෙහි ප්‍රමුඛ වැඩසටහනකි. ඉතා වැදගත් ජෛව විවිධත්ව වටිනාකමකින් යුත් වනජීවී කලාප ආශ්‍රිත පාසල් සඳහා මෙහිදී ප්‍රමුඛත්වය ලබා දී ඇත. වනජීවී කලාප අවට ඇති පාසල්වල ක්‍රියාකාරී ගුරුවරුන් හා සිසුන් කණ්ඩායම් ඒකරාශී කරමින් ඔවුන්ගේ මූලික සහභාගීත්වය හා සැලසුම් කිරීම් යටතේ කෙටිකාලීන ක්‍රියාවන් ඉගෙනීමේ සැලසුම් හරහා මෙම වැඩසටහන් සංවිධානය කරනු ලබයි.

- **ප්‍රජා සංවිධාන ශක්තීන් දියුණු කිරීම**

  වනජීවී ආරක්ෂිත කලාප තුළ හා අවට ප්‍රජාවගේ සංවර්ධන ක්‍රියාවලිය අරමුණු කරගත් සමාජානුයෝජනය දියුණු කිරීම මෙම ක්‍රියාකාරකම් වලට ඇතුළත් වේ.

- **පර්යේෂණ කටයුතු**

  මේ යටතේ අදාළ ක්ෂේත්‍රයන් තුළ විවිධ මට්ටමේ පර්යේෂණ කටයුතු සඳහා සහය ලබාදීම. විශේෂයෙන්ම විශ්ව විද්‍යාල මට්ටමේ උපාධි අපේක්ෂක, පශ්චාත් උපාධි අපේක්ෂක, පර්යේෂණ කටයුතු සඳහා සහය වීම හා උසස් පෙළ සිසුන් සඳහා ව්‍යාපෘති කටයුතු වලට සහය වීම සිදු කෙරේ.

- **සන්නිවේදන හා ප්‍රවෘත්ති අංශ ව්‍යාපෘතිය**

  වනජීවී භාරයෙහි අලෙවිසැල්හි ප්‍රකාශන කාර්යාංශය, ප්‍රදර්ශන අංශය හා සම්බන්ධ කාර්යයන් මීට ඇතුළත් වේ. දැනට වනජීවී භාරය මගින් තොරතුරු සන්නිවේදනය හා අලෙවි මධ්‍යස්ථාන 7 ක් ඉතා සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

## 2013.12.31 දිනට ආදායම හා වියදම

| මාසය | ආදායම (රු.) | වියදම (රු.) |
|---|---:|---:|
| ජනවාරි | 1,044,959.63 | 869,349.21 |
| පෙබරවාරි | 1,183,661.75 | 836,609.71 |
| මාර්තු | 782,229.00 | 1,081,885.30 |
| අප්‍රේල් | 1,008,655.63 | 936,249.49 |
| මැයි | 888,346.25 | 937,180.71 |
| ජූනි | 742,417.13 | 750,174.15 |
| ජූලි | 1,399,897.75 | 903,035.41 |
| අගෝස්තු | 1,190,237.25 | 1,011,528.99 |
| සැප්තැම්බර් | 1,932,810.25 | 690,875.47 |
| ඔක්තෝබර් | 1,205,754.00 | 1,382,496.76 |
| නොවැම්බර් | 1,828,396.08 | 849,875.15 |
| දෙසැම්බර් | 927,473.20 | 2,235,588.39 |
| **එකතුව** | **14,134,837.92** | **12,484,848.74** |